**මාර්ග නඩත්තු භාර අරමුදල (ආර්එම්ටීඑෆ්) - 2015**

මාර්ග නඩත්තු භාර අරමුදලේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ භාණ්ඩාගාර ලේකම් හා මාර්ග නඩත්තු භාර අරමුදලේ භාරකරුවන් අතර 2005 දෙසැම්බර් 09 දින එළඹි මාර්ග නඩත්තු භාර ඔප්පුවේ II වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

**1.2 මාර්ග නඩත්තු භාර අරමුදල ස්ථාපිත කිරීම.**

භාර ආඥපනත යටතේ අමාත්‍ය මණ්ඩල අනුමැතිය සහිතව 2005 දෙසැම්බර් 09 දින අත්සන් කරන ලද භාර ඔප්පුව මඟින් මාර්ග නඩත්තු භාර අරමුදල පිහිටුවා ඇත. ආරම්භයේදී මාර්ග සංවර්ධන අධිකාරිය නඩත්තු කරන මාර්ග සඳහා අරමුදල් සැපයීමට අපේක්ෂා කරන ලද අතර පසුව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය නඩත්තු කරන මාර්ග ද මාර්ග නඩත්තු භාර අරමුදලට ඇතුළත් කරන ලදී. එබැවින් ඒ හා බී පන්තියේ මාර්ග නඩත්තු කිරීම සඳහා වගකිව යුතු මාර්ග සංවර්ධන අධිකාරිය මාර්ග නඩත්තු භාර අරමුදලේ වර්තමාන ප්‍රධාන ප්‍රතිලාභියා වේ. මාර්ග නඩත්තු භාර අරමුදල භාරකාර මණ්ඩලයක් මඟින් කළමනාකරණය කරනු ලැබේ. ශ්‍රී ලංකා රජයේ වාර්ෂික අයවැය මඟින් මාර්ග නඩත්තු භාර අරමුදලට අරමුදල් සපයනු ලැබේ. ආරම්භකව 2012 වර්ෂයේ සිට 2014 සැප්තැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා රු.මිලියන 1,365 කට සමාන එජඩො මිලියන 10.5 ක් මාර්ග අංශ සහාය ව්‍යාපෘතිය මඟින් සැපයීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය විසින් එකඟ වී තිබුණි. ඉන් රු.මිලියන 1,300 කට සමාන එජඩො මිලියන 10 ක් කාලීන නඩත්තු කටයුතු සඳහා මූල්‍යයනය කිරීමට වෙන් කර තිබුණු අතර භාර අරමුදලේ පුනරාවර්තන පිරිවැය සඳහා රු.මිලියන 65 කට සමාන එජඩො මිලියන 0.5 ක් වෙන්කර තිබුණි. තවද, අරමුදල යටතේ මාර්ග නඩත්තු වැඩ අඛණ්ඩව සිදු කිරීමට එජඩො මිලියන 5.45 ක් මාර්ග අංශ සහාය ව්‍යාපෘතියෙන් මාරු කර තිබුණි. ලෝක බැංකුවේ දේශීය අධ්‍යක්ෂගේ 2015 මාර්තු 25 දිනැති ලිපියට අනුව අරමුදල සඳහා මූල්‍යයන සැලැස්ම 2015 ජුනි 30 දින අවසන් කරන ලදී.

**1.3 භාර අරමුදල**

**අරමුණු**

භාර ඔප්පුවේ 4 වගන්තිය අනුව භාර අරමුදලේ අරමුණු වන්නේ,

(අ) මාර්ග ජාලයේ පිරිහීම වළක්වා ගැනීම සඳහා ජාතික මාර්ගවල එදිනෙදා හා කාලීන මාර්ග නඩත්තු වැඩසටහන් සඳහා අඛණ්ඩව හා කාලීනව මූල්‍යයනය කිරීම.

(ආ) මාර්ග නඩත්තු කටයුතු සඳහා වහාම අවශ්‍ය නොවන අරමුදල් හෝ කොටසක් සුදුසු ආකාරයට ආයෝජනවල හා සුරැකුම්වල විචක්ෂණව හා සුපරීක්ෂාකාරීව ආයෝජනය කිරීම, එබඳු ආයෝජනයන් මඟින් අරමුදලට ඉහළම ප්‍රතිලාභයන් තහවුරු කරගැනීම සඳහා එම ඕනෑම අයෝජනයක් හෝ සුරැකුම් රඳවා ගැනීම, විකිණීම හෝ වෙනත් ආකාරයකට අපහරණය කිරීම මඟින් භාර අරමුදල කළමනාකරණය හා සංවර්ධනය කිරීම.

(ඇ) භාරයේ අරමුණු සඳහා පාදකවන සහ හෝ අවශ්‍ය පරිදි රටේ පවත්නා නීතියට අනුව රජයේ හෝ වෙනත් අධිකාරියකින්, අයිතියකින්, වරප්‍රසාදයකින්, බලපත්‍ර සහ සහන ලබාගැනීම.

(ඈ) ඕනෑම ආකාරයකින් රැස්කරගන්නා ආදායම්, භාරයේ ඉහත අරමුණු වර්ධනය කර ගැනීම සඳහා යෙදවිය යුතු අතර එම ආදායම් මුදලින් හෝ වෙනත් ආකාරයකින් පුද්ගලයන් හෝ ආයතනවලට භාරයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා නොවන කාර්යයන් සඳහා බෙදා නොහැරිය යුතුය.

(ඉ) භාරයේ ඕනෑම අරමුණක් ඉටුකර ගැනීමට අදාළ වන අනුශාංගික හෝ යෝග්‍ය වන නීත්‍යානුකූල දේ කිරීමට, සහ

(ඊ) භාරයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඔවුන් සිතන වඩාත් උචිත ක්‍රියාවෙහි යෙදීම සඳහා ඔවුන්ට පැවරී ඇති බලය සහ අභිමතය භාරකරුවන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව තහවුරු කර ගැනීම.

## 1.4 ප්‍රතිලාභීන්

--------------

භාර ඔප්පුවේ 7 වගන්තිය අනුව, භාරයේ ප්‍රතිලාභීන් වන්නේ එවකට මහාමාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, මාර්ග සංවර්ධන අධිකාරිය, එවකට පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය වර්තමානයේ පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශය හෝ භාර අරමුදලෙන් අරමුදල් ලබාගැනීමට බලය ලැබෙන භාරයේ ප්‍රතිලාභියකු වශයෙන් රජය විසින් අනුමත කරන ලද වෙනත් ඕනෑම රාජ්‍ය ආයතනයක් වේ.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.6 තත්ත්වාගණනය කළ විගණන මතය**

**------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**2.1 මතය**

**---------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට නඩත්තු භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මාගේ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**-----------------------------------------**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

**--------------------------**

භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනයෙන් ලැබුණු රු.මිලියන 1.28 ක් වූ පොලිය වෙනම ආදායම් ප්‍රභවයක් ලෙස හඳුනාගනු වෙනුවට අරමුදලේ වියදමට එරෙහිව හිලව් කර තිබුණි.

**2.2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

**----------------------------------------------------**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 වගන්තිය ප්‍රකාරව භාර අරමුදලේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කර ඉකුත් වර්ෂයේ සැප්තැම්බර් 15 හෝ ඊට පෙර ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයාට හා රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයාට පිළියෙල කර ඉදිරිපත් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනය පිළියෙල කර නොතිබුණි. තවද එකී චක්‍රලේඛයේ 4.3 වගන්තිය ප්‍රකාරව පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

**3. මූල්‍ය කාර්ය සාධනය**

**----------------------------**

**3.1 අරමුදල් උපයෝජනය**

**------------------------------**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළ හා 2015 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යාලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව වෙන්කිරීම | | උපයෝජනය කළ මුදල | | | |
|---|---|---|---|---|---|---|
| | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන | එජඩො මිලියන | රු.මිලියන |
| ප්‍රදාන නියෝජිතායතනය | 15.95 | 2073.5 | 4.036 | 542.69 | 12.33 | 1,626.47 |
| ශ්‍රී ලං ර | - | - | - | 4,259.80 | - | 14,456.73 |
| එකතුව | 15.95 | 2,073.5 | 4.036 | 4,802.49 | 12.33 | 16,083.20 |

මාසික, කාර්තුමය හා වාර්ෂික ආදී වශයෙන් අපේක්ෂිත මූල්‍ය හා භෞතික ඉලක්ක මතු කර දක්වමින් නිශ්චිත කාල පරිච්ඡේදය තුළ අරමුදලේ සතුටුදායක ක්‍රියාත්මක වීම තහවුරු කර ගැනීම සඳහා සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි විස්තරාත්මක සමස්ත සැලැස්මක් පිළියෙල කළ යුතුය. කෙසේ වුවද එවැනි සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස එජඩො මිලියන 15.95 ක්වූ මුළු වෙන් කිරීමෙන් අරමුදලේ කාල පරිච්ඡේදය අවසානයට එජඩො මිලියන 12.33 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

මාර්ග නඩත්තු කාර්යයන් සඳහා මාර්ග සංවර්ධන අධිකාරියට අරමුදල් සැපයීමට අමතරව ජාතික මාර්ග 12 ක මාර්ග කොටස් කිහිපයක නඩත්තු වැඩ, මාර්ග නඩත්තු භාර අරමුදල විසින් සිදු කර තිබුණි. ප්‍රගති වාර්තා අනුව, 2013 හා 2014 වර්ෂවලදී ආරම්භ කරන ලද මුළු දිග කිලෝමීටර 59.6 ක් වූ ජාතික මාර්ග 12 ක නඩත්තු වැඩ රු.මිලියන 3,201.8 ක පිරිවැයකට 2015 දෙසැම්බර් 31 දිනට සිදු කර තිබුණි. තවදුරටත් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) තිරසාර මාර්ග නඩත්තු මූල්‍යයනයක් සැපයීමේදී භාර අරමුදලේ ඵලදායීත්වය තක්සේරු කිරීම සඳහා හා භාර අරමුදලේ මෙහෙයුම් වැඩිදියුණු කිරීමේ ක්‍රම පරීක්ෂා කිරීම සඳහා භාර අරමුදලේ කාර්යයන්, භාර අරමුදල ආරම්භයේ සිට වර්ෂ 3 කට පසුව සමාලෝචනය කළ යුතුය. 2006 ජනවාරි 1 සිට භාර අරමුදල ක්‍රියාත්මකව තිබුණද, භාර අරමුදලේ කළමනාකරණ මණ්ඩලය විසින් භාර අරමුදලේ මූල්‍ය හා භෞතික කාර්ය සාධනය සමාලෝචනය කර නොතිබුණි.

(ආ) 2005 ඔක්තෝබර් 26 දින ගන්නා ලද අමාත්‍ය මණ්ඩලයේ තීරණයට අනුව, 2006 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි පෙට්‍රල් හා ඩීසල් විකිණීමෙන් රජයට ලැබෙන ආදායමෙන් පෙට්‍රල් එක් ලීටරයකින් රු.1 ක් හා ඩීසල් එක් ලීටරයකින් රු.0.50 ක් භාර අරමුදලට බැර වනසේ රජය විසින් වෙන් කළ යුතුය. කෙසේ වුවද යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා විධිමත් පරිපාටියක් 2015 දෙසැම්බර් 31 වන විටත් අනුගමනය කර නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**--------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග නඩත්තු වැඩ පිළිබඳ ප්‍රමාණ පත්‍රවල පිරිවැය ඇස්තමේන්තුවල ඉතිරිවීම් භාර අරමුදලේ ප්‍රගති වාර්තාවල නිරන්තර ලක්ෂණයක් ලෙස වාර්තා වී තිබූ අතර මාර්ග නඩත්තු වැඩවල විෂය පථය, බිමෙහි තත්ත්වය සමීක්ෂණය කිරීමෙන් පසු විධිමත්ව තීරණය කර නොතිබුණු බව ඒ අනුව නිරීක්ෂණය විය. භාර අරමුදල විසින් සිදු කරන ලද මාර්ග නඩත්තු වැඩවල පිරිවැය ඉතිරිවීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| මාර්ගයේ නම | මාර්ගයේ ප්‍රමාණය | ඉතිරි කළ පිරිවැය<br>රු.මිලියන |
|---|---|---|
| කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගය | කිලෝමීටර් 38+400- කිලෝමීටර් 45+500 | 5.65 |
| කටුගස්තොට - කුරුණෑගල - පුත්තලම මාර්ගය | කිලෝමීටර් 54+000 කිලෝමීටර් 62+330 | 29.19 |
| පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය | කිලෝමීටර් 03+100 - කිලෝමීටර් 09+000 | 33.33 |
| පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගය | කිලෝමීටර් 09+000 - කිලෝමීටර් 13+700 | 32.51 |
| කටුනායක - වේයන්ගොඩ මාර්ගය | කිලෝමීටර් 0+000 - කිලෝමීටර් 4+000 | 95.66 |
| කටුනායක - වේයන්ගොඩ මාර්ගය | කිලෝමීටර් 4+000 කිලෝමීටර් 9+500 | 3.21 |

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.14.1 ඡේදයට පටහැනිව කටුනායක - වේයන්ගොඩ මාර්ගයේ මතුපිට ගල් තාර (Asphalt) ඇතිරීම හා නඩත්තු කිරීම සඳහා කොන්ත්‍රාත්තුව පැකේජ 02 කට බෙදා රු.මිලියන 313.40 ක් හා රු.මිලියන 267.67 ක් වූ ඇස්තමේන්තුගත පිරිවැයකට 2014 දෙසැම්බර් 16 දින එකම කොන්ත්‍රාත්කරුට පිරිනමා තිබුණු බව නිරීක්ෂණය විය. තවද ඒ සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

**------------------------------------**

පේරාදෙණිය - බදුල්ල - චෙන්කලාඩි මාර්ගයේ කිලෝමීටර් 3.1 සිට කිලෝමීටර් 09 දක්වා මාර්ග කොටසේ නඩත්තු කටයුතුවල යෙදුණු කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිරිපත් කරන ලද බිල්පත්‍රවල විෂයයන් 14 ක් යටතේ රේටයන් සියයට 100 සිට සියයට 997 දක්වා පරාසයකින් ඉංජිනේරු ඇස්තමේන්තුවේ යොදාගත් රේටයන් ඉක්මවා තිබුණි. තවද ඒ සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

**3.5 පරිබාහිර කාර්යයන්**

**-----------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අරමුදල සඳහා මූල්‍යායන සැලසුම් 2015 ජූනි 30 දිනට අවසන් කර තිබුණද, 2015 ජූලි මාසයේදී එක්සත් රාජධානියේ බර්මිංහැම් විශ්වවිද්‍යාලයේ පවත්වන ලද විදේශ පුහුණුවක් සඳහා පාඨමාලා ගාස්තු හා අනියම් දීමනා ලෙස රු.මිලියන 3.02 ක මුදලක් වැය කර තිබුණි.

(ආ) මාර්ග අංශ සහාය ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයන වාර්තාව පරිදි, පිළිගත් මාර්ග නඩත්තු ප්‍රමිතීන්/ අත්පොත් යොදා ගනිමින් නියැදි පදනම මත මාර්ග නඩත්තු පිළිබඳ තාක්ෂණික විගණනයන් පැවැත්වීම සඳහා අරමුදලේ ලේකම් කාර්යාලය අඛණ්ඩව නිරත විය යුතු අතර ප්‍රධාන කාර්යසාධන දර්ශක වලට අනුකූලව නඩත්තු පිළිබඳ ගුණාත්මක තත්ත්වය තහවුරු කළ යුතුය. තවද තාක්ෂණික විගණනයන් පිළිබඳ කාර්යසාධන වාර්තා අරමුදලේ භාරකරුවන් වෙත ඉදිරිපත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) මධ්‍යම පළාතේ ජාතික මාර්ග නඩත්තුව සඳහා වෙන් කරන ලද රු.මිලියන 310.36 ක මුදලින්, මධ්‍යම පළාතේ පළාත් මාර්ග 38 ක මාර්ග නඩත්තු වැඩ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු.මිලියන 38.23 ක මුදලක් වැය කර තිබුණි.

(ඈ) මාර්ග හා නඩත්තු භාර අරමුදල සඳහා ලේකම් කාර්යාලයක් ස්ථාපිත කිරීමට හා මාර්ග නඩත්තු කාර්යයන් පිළිබඳ ප්‍රතිපත්ති තීරණය කිරීමට උපදේශක සේවා සඳහා රු.මිලියන 81.55 ක මුදලක් වැය කර තිබුණද, උපදේශකවරුන් විසින් හඳුන්වා දෙන ලද මාර්ග නඩත්තු ප්‍රතිපත්ති පිළිබඳ නිර්දේශයන් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි. කෙසේ වුවද, උපදේශක සේවා ගිවිසුම 2014 නොවැම්බර් 11 දින අවසන් කර තිබුණි.

### 3.6 මූල්‍ය පාලනය පිළිබඳ ගැටලු

මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සමාලෝචිත වර්ෂය තුළ අරමුදලේ ගනුදෙනු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණනයට භාජනය කර නොතිබුණි.